ටැම් පිට පිළිමයේ - 1

චාල්ස් ගොඩකුඹුරේ

ගෘහ විශේෂය

ටැම්පිටපිළිමගේ නොහොත් ටැම්පිටවිහාරගේ යන්නෙන් හඟවන්නේ ගල්කණු පිට දැව ඇද ඊ මත්තේ ලැලි අතුරුවා ඒ උඩ බිත්ති බැඳ කරන පිළිමගෙයකි. ටැම්පිටපිළිමගේ යන්න අන්‍යාර්ථ-සමාසපදයකි. සංස්කෘත ව්‍යාකරණානුසාරයෙන් කියනවා නම් බහුව්‍රීහිසමාසපදයකි. ඒ දැන ''ටැම්-පිටපිළිමගේ'' නොහොත් ''ටැම්පිටවිහාරගේ'' යනු එකපදයක් සේ ලියයුතුයි.

මේ අපේ ලිපිය එහි මාතෘකාව වන පදය ව්‍යාකර-ණානුකූලව විග්‍රහ කිරීමෙන් ආරම්භ කරන්නේ පදයෙහි අර්ථය සකසා නොදැන එම පදය මුල්කොට ලියන දෙයක අදහස අවබෝධකරගැනීම උගහට හෙයිනි. අප විසින් මෙම ලිපියේම මතු ගෙනහැර දක්වන මැදවලතඹසන්නසේ එන ''සත්රියන් ටැම්-පිටපිළිමගෙයක් කරවා'' යන්න ඇතැමෙක් ''සත්-රියන් ටැම් පිට පිළිමගෙයක්'' කරවා යයි වරදවා ගත්තා. එහෙත් ඒ පිළිමගේ සාදු තිබෙන්නේ පද-නමින් ඉහළට අහල් විසිඑකක් උස්වූ ගල්ටැම්පිටය. පදනමද අහල් විස්සක් පොළොවෙන් උස් කරළාය. සත්රියන් යන්නෙන් අදහස් කරන්නේ ටැම්පිට-පිළිමගෙයි වර්ගප්‍රමාණයයි.

ප්‍රභවය

මෙසේ මෙම පිළිමගෙවල් විශේෂයෙහි නාමාර්-ථය හැඳින ඒ නිර්මාණය සිංහළ රටේ ප්‍රභවයවූ අන්දම සොයා බලමු.

සිංහළ වාස්තුවිද්‍යාවෙහි ''මහල'' යන පදයෙන් වර්තමාන ව්‍යවහාරයේ ගෙවල් සෑදීම සම්බන්ධ-යෙන් භාවිතා කරන ''තට්ටුව'' යන අර්ථය ගෙන දෙයි. ඇතැම් තැන පොළොවෙන් උසට ගොඩනැඟූ පිළක් සහිත අත්තිවාරමද මහලක් හැටියට ගනු ලැබෙනවා. කැළණිය වැනි සිද්ධස්-ථානයන්හි මාලාවන් දෙකකින් හෝ තුනකින් කළ සර්වඥමන්දිරයන් තිබූ බව:

දෙමහල් තුන්මහල් මුනිහල් දිසි නොම ද
ආදිපාඨයන්ගෙන් කියවෙනවාය. (**හංස සන්දෙශය,** 95 බලනු).

අනුරාධපුරයේ ද්විමාලික බුද්ධප්‍රතිමාගෘහයක් ගැන නිශ්චය වශයෙන් බලාගන්ට බැරිවූ නමුත් පොළොන්නරුවේ දෙමහල් බුදුපිළිමගෙවල් දෙකක් ගැනම අපි දන්නවාය. මේ දෙකම උඩුමාලේ දළදාතුන්වහන්සේ වැඩසිටුවීමටද පහතමාලේ සර්වඥප්‍රතිමාවහන්සේලා පිහිටුවීමටද කරනලදි. මෙයින් පළමුවැන්න මහළුවිජයබාරජු විසින් කළ



1 වෙනි ඡායාරූපය—දඹදෙණියේ පිළිමගේ

අටදගෙයය. දෙවැන්න කීර්ති නිශ්ශංකමල්ල රජු කළ හැටදගෙයය. මේ පිළිමගෙවල් දෙකේම උඩුමහලට ගිය පියගැටපෙළවල අවශෙෂයන් තවම දකින්ට ලැබෙනවාය. දඹදෙණියේ දෙමහල් නැතහොත් තෙමහල් දළදමැදුර ප්‍රතිසංස්කරණ පරම්පරාවෙන් වුවත් තවම මුලින් කළ තැනම තිබෙනවා (1 වෙනි ඡායාරූපය). බුදුගෙවල් උඩුමහලක් ඇතුව සෑදීමට මුල් හේතුව උඩුමහලේ දළදවහන්සේ තැන්පත් කිරීමටයයි සිතන්ටත් ඉඩ ඇත. පසුව උඩුමහල අනිකුත් ධාතූන් වහන්සේලා තැන්පත් කිරීමට යොදන්ට වුණා. මෙයින් ඇතිවූ එක් ප්‍රතිඵලයක් නම් දෙමහල් බුදුගෙයක් හෝ දෙමහල් පිළිමගෙයින් ප්‍රභවවූ ටැම්පිටවිහාරගෙයක් හෝ ඇති තැනක දගැබක් අනවශ්‍යවීමයි.

දෙමාල් පිළිමගෙයක් මතුකලකදී ටැම්පිටවිහාරගෙයක් බවට පරිවර්තනය කළ කථාවක් අපි මෙම ලිපියෙන් මතු විස්තර කරන මැදවලවිහාරගේ පිළිබඳ ඉතිහාසය කියවෙන සන්තසේම සඳහන් වේ. එසේම මෙම ලිපි පංක්තියේදී පසුවට විස්තර කරන්ට අදහස් කරන අම්බුළුගල ටැම්පිටවිහාරගේ පිළිබඳ පුරාවිද්‍යාත්මක පරීක්ෂණවලදී එයද මුලදී දෙමහල් පිළිමගෙයක් වශයෙන් තිබූ බව නිසැකව පෙනිගියාය. තවද ටැම්පිටපිළිමගෙවල් වැඩි වශයෙන් කරනලද කාලයේදී, ඒ ස්ථානයේ දගැබ් නොකළ බවට සාක්ෂිද මතු සඳහන් වන දෙරබාවිල ආදි ස්ථානවලින් ලැබෙනවාය. මීට හේතුද මතුවට විමසමු.

බුදුමුත්තාවේ දෙමහල් විහාරගේ
(2 වෙනි ඡායාරූපය)

සිංහළ සාහිත්‍යයේ යම් ගොඩනැගිල්ලක් කාව්‍යාලංකාරමුඛයෙන් විනා සැබෑ අන්දමින් වර්ණනා




2 වෙනි ඡායාරූපය—බුදුමුත්තාවේ විහාරගේ

කරන තැනක් ලැබෙන්නේ කලාතුරකිනි. එහෙත් තෙමහල් බුදුපිළිමගෙයක් දහනවවන ශතවර්ෂයේ මුල්භාගයේදී හත්කෝරළයේ විසූ මිදැල්ලව කෝරාළ නම් කවිදුන් විසින් ක්‍රිස්තුවර්ෂ 1836යේදී කරනලද **තිසරසන්දෙශය** නම් සිවුපද පොතේ එනවාය. මෙම සන්දෙශකාව්‍යය සම්බන්ධ විස්තරයක් අප විසින් **රාජකීය ආසියාතික සමිතියේ ලංකා ශාඛාවේ සඟරාවට** වර්ෂ 1953 නේ දී සපයා ඇත. එහි විස්තර කරන්නේ වර්තමාන කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිකවැරටිය අසළ පිහිටි වන්නිහත්පත්තුවබඳ මහුල්ඕතොට කොරළයට අයත් බුදුමුත්තාවේ තෙමහල්විහාරගෙයයි.

1. සි නි ය න් ලෙ සි න්
දෙනිසක් ලකුණෙන්ම සැදු
ග ණ ර න් කො හි න්
ගෙන සුර බඹ මුදුන සැදු
ප ත මි න් මෙ තු න්
ලොව දන මන කර පුබුදු
එ ත නි න් ගො සි න්
මුනි තෙමහල්පාය වඳු (34)

2. ද කි මි න් බු දු න්
සිරිපාමුල වැටිලා
ව දි මි න් උතුන්
නියරස් ගහ ගිලිලා
ප ත මි න් නි ව න්
මොක්මහ සිත ඇලිලා
එ ත නින් ව රෙ න්
වැද දකුණට හැරිලා (35)

3. කොටමින් ග එ න්
සදවා බිම ඔට්ටු කොට
අ දි මි න් ද ව ත්
ඒ මතුපිට නට්ටු කොට
ත බ මි න් තෙ බ න්
හැම වඩුවැඩ කිට්ටු කොට
හි ට ප න් ඇ වි න්
මතුපිට දැවතට්ටු පි ට (36)




3 වෙනි ඡායාරූපය—මැඳවල පිළිමගේ (තහවුරු කිරීමට පෙර)

4. ය ට ලී ත ල න්
කොඳු පේකඩ තරු සැදුන
කැ ට ලී කැ ට න්
උළුවහු ගෝනැස් පෙළින
කෙ ටිලී කෙ ටු න්
හැම වඩුවැඩ නිම කරන
ව ට ලී ප ට න් දැක
සැනසෙව සිත ලෙසින (37)

5. නි යා යකඩ ඇන දී
වඩිගු තද කොට
සො යා උළු සෙවිලි
කොන් පලඳා රුවට
අ යා ඉසට කුඩගත්
මහබඹ ඉසට
ද යා කර තිසර
නෙත හැර බල සොඳට (38)

6. වැ ලින් වැ ල ට
පැහැදී මැද නැමී අතු
ම ලින් ම ල ට
තුඩදෙන ගිරවුන් පැවතු
ක ලින් ක ල ට
ඇඳ බබලන රුවිනි බිතු
පෙ ලින් පෙ ල ට
බල හිත්තර වැඩ දිමුතු (39)

7. සිවු සිවු නරක
සිවු සිවු නැනක නිසික න
සිවු සිවු නරක
සිවු සිවු ගිනි කඳ පැ නි න
සිවු සිවු නරක
සිවු සිවු ගිනි කඳ පැ නි න
සිවු සිවු නරක
සිවු සිවු විට දකු සොඳින (40)




4 වෙනි ඡායාරූපය—මැඳවල පිළිමගේ (තහවුරු කිරීමට පසු)

8. තුන් තුන් පොලෙක
තුන් තුන් දෙවු ලොව සැදුන
තුන් තුන් පොලෙක
තුන් තුන් දෙවු ලොව සැදුන
තුන් තුන් පොලෙක
තුන් තුන් දිව සැප සැදුන
තුන් තුන් පොලෙක
තුන් තුන් විට දකු සොඳින (41)

9. පන්සිය පණස්
කුස මුනිදුන් උපන් ව ර
පන්සිය පණස්
තැනදින් කරපු පෙර හ ර
පන්සිය පණස්
තැනදී කළ පුද නො හැ ර
පන්සිය පණස්
ජාතක වැඳපන් තිසර (42)

10. නා ර ද ලෙසට
වයිරෙන් මුනිසඳට කිපූ
සෝ ර දරණලා
සියොලහෙහිම සිටපූ
පා ර නොදැන
ඉසඳෑ අතටම දුවපූ
මා ර සෙනහ
බල මුනිඳුට යුද කරපූ (43)

11. සැ ර ග ම නි න්
පහසක් නොව ලබාලා
නි ස ර හ ණ න්
ඇත බිතුපිට ලියාලා
මෙ ත ඟ ක තු න්
යයි රසබස් දෙඩාලා
නො රැ ව ටි ය න්
නගෙ කත යයි කියාලා (44)





ඡායාරූප 5—6 — මැදවල පිළිමගෙයි බිතුසිතුවම් (උරග ජාතකය)





ඡායාරූප 7—8 — මැදවල පිළිමගෙයි බිතුසිතුවම් (වෙස්සන්තර ජාතකය)

මෙහි පළමුවන්නට එන සිවුපදයේ ''තෙමහල්-පාය'' යන්නෙන් අදහස් කරන්නේ උස් අත්තිවාර-මක්පිට ගොඩනැඟූ දෙමහල් බුදුගෙයක්යයි ගත හැකියි. දෙවෙනි සිවුපදයෙන් තිසරපක්ෂිරාජයාට බුදුන් වැඳ පිටවෙන්ට කියත්. ඉන්පසු පක්ෂිරාජයා තෙමහල්පායේ දැවතවිටුපිට ඉඳගෙන ඒ ප්‍රාසාදයේ විශෙෂ අංග හා ඒ එක එක නිර්මාණයකර ඇත්තාවූ අන්දම පරීක්ෂාවෙන් බලයි. තුන්වන සිවුපදයේ සිට පස්වන සිවුපදය දක්වා විහාරගේ කර තිබෙන හැටි විස්තරයකි. හයේ සිට එකොළොස දක්වා බිත්තිවල ඇඳ තිබූ සිත්තම්වල විශෙෂ වර්ණනා-වකි.

බුදුමුත්තාවේ මෙම තෙමහල්පායෙහි මේ කියන සිත්තම් ආදිය දැන් නැත. ස්ථානය හා ගොඩ-නැගිලිද බොහෝසෙයින් වෙනස්කරළාය.

මැදවල ටැම්පිටපිළිමගේ (3 - 4 වෙනි ඡායාරූප)

මහනුවර දිස්ත්‍රික්කයේ හාරසියපත්තුව බඳ මැද-සියපත්තුවේ මැදවල නම් ගමේ දැනට පිහිටියාවූ ටැම්පිටපිළිමගේ ක්‍රිස්තු වර්ෂයෙන් දහහතරවන සියවසෙහි කළ දෙමාල්පිළිමගෙයකින් පරිවර්ත-නයවූවාක් බව මැදවල රජමහවිහාරයට අයත් තඹසන්නසේම කියවෙනවාය. මේ පිළිබඳ ඉතිහාස ප්‍රවෘත්තිය හා පුරාවිද්‍යාත්මක තොරතුරු අප විසින් ලියා පළකරනලද **1959 වර්ෂය සඳහා පුරාවිද්‍යාකොමසාරිස්තැනගේ පාලන වාර්තාවේ** 16, 17, 18 වන පිටුවල (එහිම අංක 3, 4, 5 දරන ඡායාරූප සමග ගතයුතුයි.) එනවාය. දෙමාල්-පිළිමගෙයිවූ චිත්‍රකර්මයන්හි විස්තරය එම වාර්තා-වේ ඇතුළත් නොකළ හෙයින් මෙහි දක්වමු. ''.....ඉහුල් මකුල් ආදි වෙතිවිටියෙලත් ගෙන්වා සිතුවම් පටන්ගෙන උඩුමාලේ වැඩසිටි පිළිම තුන්නමක් හා වියන්සිත්තම් හා හික්තියේ එක්දස්එක්සිය අසූසනමක් පිළිම අඳවා යටමාලේ මිලිතොරණ සහිත වජ්රාසනාරූඪව වැඩඋන් පිළිම-සාමීන් ඇතුළුවූ ශක්‍ර බ්‍රහ්ම විෂ්ණු මහේස්වර සුයාම සන්තුෂිතාදිදෙවතාරූප හා විජම්භනාරදෙ-ශනා ධම්සක්පවතුන්සූත්‍රාදි නොයෙක් දෙශනා කළ තැන් හා නාලාගිරිදමනාදිදමන හා අටජාතකාදි නොයෙක් ජාතක හා සත්සති ඉන්ද්‍රසාලගුහාදි නොයෙක් අපූර්වවූ චිත්‍රකර්මාන්ත කිප අවුරුද්ද-කින් සම්පූර්ධවූ පසු.....''

මේ කියන චිත්‍රකර්මාන්ත නැතිවීගියත් පළමු වෙන් කළ දෙමාල්පායට අයත් ගලින් කළ ''ගජසිංහ දෙන්නාද කිබිසිලියවැලි කර්මාන්තද සඳකඩපානද පිළිමගෙට නැගෙන්ට තැනූ ගල් පඩිද'' විහාර භූමියේ ඇත. (ඉහත සඳහන් පුරාවිද්‍යා වාර්තාවේ 17 වන පිට බලනු.)



දනේ ගෙනයාම

9 වෙනි ඡායාරූපය—මැදවල පිළිමගෙයි බිතුසිතුවම්

මෙකියනලද දෙමහල්පාය ජරාවට පත්වූ පසු මහනුවර රජකළ කීර්තිශ්‍රීරාජසිංහ රජ විසින් ''විහාරභූමිය කටුකොහොල් හරවා පවුරුපදනම් බඳවා දැවගොනැස් සහිත කොට සත්රියන් ටැම්-පිටපිළිමගෙයක්'' කරවිය. අළුත් පිළිමගෙයි කළ ප්‍රතිමා චිත්‍රකර්ම ආදිය පිළිබඳවද මෙසේ කියා ඇත. ''එහි මිලිතොරණ සහිත වජ්රාසනාරූඪව

10 වෙනි ඡායාරූපය—මැඳවල පිළිමගෙයි බිතුසිතුවම් කරඬුව වැඩමවීම





වැඩවුන් පිළිමසාමීන් ඇතුළුවූ සක්‍රබ්‍රහ්මසුයාම-සන්තුෂිතාදිදෙවතාරූප හා ශාරිපුත්‍රාදිමහාශ්‍රාවක-රූපපන්තීන් හා උරහජාතක විශ්වන්තරාදිජාතක තුෂිතභවනයෙහි වැඩහුන් මෛත්‍රීරූප හා නොයෙක් වර්ණ සමලංකෘත වියන් සිත්තම් භික්ති සිත්තම් ආදීන් නිමවා උභයපාර්ශ්වයෙහි බඬගහස්තොපලක්ෂිතවූ භූතරූපයුග්මයක් හා නානාවර්ණ චිත්‍ර කර්මාන්තයෙන් බබුලුවා.''

මෙහි විස්තර කරන ලද සත්‍රියන් ටැම්පිට-පිළිමගේ පුරාවිද්‍යාදෙපාර්තමේන්තුව විසින් ප්‍රති-සංස්කරණය හා තහවුරුකොට එහි චිත්‍රකර්ම්‍යන්තා-දියද ආරක්ෂාවීමට පිළියම් යොදා නිමවූයේ වර්ෂ 1959 යේ දී ය.

බොහෝසෙයින් නැතිවී ගොස් ඇති ගෘහනිර්මාණ සම්ප්‍රදායක හා චිත්‍රකර්ම විශෙෂයක උදාහරණයන්වූ මැඳවල ටැම්පිටපිළිමගේ සම්බන්ධ වාස්තුවිද්‍යාත්-මක සැලසුම්ද විහාරගෙයිද සිත්තම් හා රූකම් ස්වල්පයකද ඡායාරූපත් මෙහි ගෙනහැර ප්‍රසිද්ධ කරමු. — 5 වෙනි ඡායාරූපය සිට 16 වෙනි ඡායාරූපය දක්වා බලනු.

11 වෙනි ඡායාරූපය—මැඳවල පිළිමගෙයි බිතුසිතුවම් සැතපෙන බුදුන්





12 වෙනි ඡායාරූපය—
මැදවල පිළිමගෙයි බිතුසිතුවම්
හිටි බුදුරුවක්

සැලසුම්

(1) මැදවල ටැම්පිටපිළිමගෙයි පැත්ත පෙනෙන ආකාරය.
(2) මැදවල ටැම්පිටපිළිමගෙයි මාලකයේ බිම් සැලැස්ම.

ඡායාරූප

1 වෙනි ඡායාරූපය: දඹදෙණියේ තෙමහල් නොහොත් දෙමහල් පිළිමගේ.
2 වෙනි ඡායාරූපය: බුදුමුත්තාවේ දෙමහල්පිළිමගේ නොහොත් ටැම්පිටපිළිමගේ.
3 වෙනි ඡායාරූපය: මැදවල ටැම්පිටපිළිමගේ: තහ වුරු කිරීමට පෙර දික්අතින් පෙනුණු හැටි. ගරාදිවැටේ කොටසක් කැඩී නැතිවී ගොසින්ය. වහලේ පහල පලේ වටලුළු සෙවිල්ලාය. අත්තිවාරම් පදනමේ ගල් ගැලවී ගොසින්ය. දැව බොහෝසේ දිරාපත්වී තිබූ බවද පෙනේ.
4 වෙනි ඡායාරූපය: මැදවල ටැම්පිටපිළිමගේ: තහ වුරු කිරීමට පසුව දික්අතින් පෙනෙනහැටි. ගරාදිවැටේ අඩුතැන්වලට පැරණි වැඩ අනුව



13 වෙනි
ඡායාරූපය—
මැදවල පිළිමගෙයි
බිතුසිතුවම්
බෝමැඩමුල
වැඩ ඉන්නා බුදුන්



14 වෙනි
ඡායාරූපය—
මැඳවල පිළිමගෙයි
බිතුසිතුවම්
නාගදරණයේ
වැඩ ඉන්නා බුදුන්

ලී සාදු යොදු ඇත. වහල සම්පූර්ණයෙන් පුරාණ පෙතිඑළු සැලැස්මට අළුතෙන් තැනූ උළු සෙවිලිකරලා ය. පදනමේ ගල් සීරුවට අල්ලලාය. පැරණි දිරාපත්වූ දැව වෙනුවට ඒ ආකාරම වූ අළුත් දැව යොදලාය. විහාරගෙට නැගීමට ලීයෙන් කළ පඩිපෙළක්ද එක්කර ඇත.

5-6 වෙනි ඡායාරූප: මැඳවල ටැම්පිටපිළිමගෙයි බිතුසිතුවම්. උරගජාතකය (සිංහල ජාතක පොතේ මුනසිංහ මුද්‍රණයේ පිටු 604 - 606 දක්වා බලන්න.)

7-8 වෙනි ඡායාරූප: මැඳවල ටැම්පිටපිළිමගෙයි බිතුසිතුවම්. වෙස්සන්තර ජාතකය.

9 වෙනි ඡායාරූපය: මැඳවල ටැම්පිටපිළිමගෙයි බිතුසිතුවම්. දුනේ ගෙනයෑම.

10 වෙනි ඡායාරූපය: මැඳවල ටැම්පිටපිළිමගෙයි බිතුසිතුවම්. කරඬුව වැඩමවීම.

11 වෙනි ඡායාරූපය: මැඳවල ටැම්පිටපිළිමගෙයි, බිතුසිතුවම්. සැනපෙන බුදුන්. ඇඳ පාතරට ඕලන්ද කර්මාන්තයකි. මදුරුදූලක්ද වේ. දහඅටවන ශතවර්ෂයේදී මහනුවර රාජපරිහොගයට ගත් ඇඳක් බලා සිතුවම් කර ඇතැයි කියයුතුයි.

12 වෙනි ඡායාරූපය: මැඳවල ටැම්පිටපිළිමගෙයි බිතුසිතුවම්. බෝරුකක් දෙපැත්තේ ඇඳ ඇති හිටිබුදුරු දෙකකින් දකුණේ රූපයයි. අත්දෙක හරහට එකිනෙක පිට තබාගෙන කල්පනාකාරීව සිටිනාසේක. පොළොන්නරුවේ පිරිනිවි බුදුන් පාමුල සෝකයට පත් ආනන්ද මහතෙරුන්වහන්සේගේ රූපයයයි කියන රුව මෙනි. හිස වටේ ඇති රශ්මිජාලාවෙන් නිසැකවම බුදුරුවක්යයි කියහැකිය. වම්පැත්තේ රූපය අභයමුද්‍රාවෙන්ය.

13 වෙනි ඡායාරූපය: මැඳවල ටැම්පිටපිළිමගෙයි, බිතුසිතුවම්. බෝමැඩමුල බුදුබවට පත්ව වැඩඉන්න බුදුන්. මාරදූන් නැටුම් දක්වා බෝසතාණන් වසඟකරන්ට බැරිවී ඔවුන්ගේ පාශයනුත් ගෙන පසු බසී.

14 වෙනි ඡායාරූපය: මැඳවල ටැම්පිටපිළිමගෙයි බිතුසිතුවම්. බෝමැඩමුල මුවලින්ද නාගදරණයේ වැඩඉන්නා බුදුන්.


15-16 වෙනි ඡායාරූප: මැඳවල 14 වන ශතවර්ෂයේ කළ දෙමාල් පිළිමගෙට අයත් ගලින් කළ ගජසිංහ හා කිබිසිලියවැල් කර්මාන්ත. මේ ඡායාරූප දෙකින් පෙන්වන්නේ එක ගලේම දෙපැත්තයි.






ඡායාරූප 15—16—මැදවල විහාරය ගජසිංහ හා කිබිසිලියවැල්

මැදවල පිළිමගේ



පැත්ත පෙනෙන හැටි



මාලකයේ බිම් සැලැස්ම

